ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ පල්ලෙකැලේ සංචාරක බංගලාව වෙන් කරවා ගැනීම හෝ ඔබගේ නිවාඩුව සුව පහසුව ගත කිරීම සඳහා හෝ ජංගම රාජකාරි කටයුතු ඉටු කර ගැනීම සඳහා හෝ තෝරා ගැනීම පිළිබඳ ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙමු.

මෙම සංචාරක බංගලාවේ පවතින පහසුකම් ඔබ වෙත සාදරයෙන් සපයනු ලබන්නේ ඉතා අවම සුබ සාධන මිලක් යටතේ වන අතර ,සංචාරක බංගලාවක් නඩත්තු කිරීම සඳහා රජය වාර්ෂිකව විශාල මුදලක් වැය කරන බවද දැනුම් දෙමු.මෙම සංචාරක බංගලාව හා එයට සම්බන්ධිත භාණ්ඩ , ගෙවත්ත යනාදිය පොදු දේපල වන අතර , මෙය මනාව පවත්වා ගෙන යාම සඳහා ඔබගෙන් හා ඔබ සමඟ නවාතැන් ගනු ලබන අයගෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකන්නෙමු.

එලෙසම මෙහි සඳහන් වන කොන්දේසි සඳහා අවධානය යොමු කරවා ඔබගේ නිවාඩු දිනයන් සතුටින් ගත කිරීමට හා අර්ථවත්ව යොදා ගැනීමට කටයුතු කරන මෙන්ද ඉල්ලා සිටිමු.

***<u>බංගලාවේ ඇති කාමර පිළිබඳ තොරතුරු</u>***

***<u>කාමර අංක 01.</u>*** *ද්විත්ව ඇඳන් 02*

***<u>කාමර අංක 02..</u>*** *ද්විත්ව ඇඳන් 02*

***<u>කාමර අංක 03..</u>*** *ද්විත්ව ඇඳන් 01.*
*තනි ඇඳන් 01*



*සංචාරකබංගලාව වෙන් කිරීම සඳහා සංචාරක බංගලාව වෙන් කරවා ගැනීම සඳහා වූ අයදුම් පත පුරවා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන අතර වෙන් කිරීම් කල්වේලා ඇතුව වෙන්කරවා ගැනීම ඔබට සහ අප දෙපාර්තමේන්තුවට යන දෙපාර්ශවයටම පහසු වේ*

*කාමර සඳහා අය කරන ගාස්තු පහත පරිදි වේ*

| කාමර අංක | නිවාඩුවේ ස්වභාවය | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | ඉඩම් අමාත්‍යාංශය | අනෙකුත් රාජ්‍ය ආයතන | අර්ධ රාජ්‍ය ආයතන | බාහිර පුද්ගලයින් |
|---|---|---|---|---|---|---|
| කාමර අංක 01 | රාජකාරි | * | 750/- | 900/- | 1000/- | - |
| | රාජකාරි නොවන | 150/- | 200/- | 500/- | 600/- | 1500/- |
| කාමර අංක 02 | රාජකාරි | * | 750/- | 900/- | 1000/- | - |
| | රාජකාරි නොවන | 150/- | 200/- | 450/- | 550/- | 1500/- |
| කාමර අංක 03 | රාජකාරි | * | 125/- | 300/- | 400/- | - |
| | රාජකාරි නොවන | 750/- | 1350/- | 1500/- | 1875/- | 1125/- |

එක් නිලධාරියකු විසින් කාමර 02 ක් හෝ 03 ක් වෙන් කිරීම් සිදු කරන විට මුළුතැන් ගෙය භාවිතා කිරීම සහ පිරිසිදු කිරීම් සඳහා එක් දිනයක් සඳහා ගාස්තුව රු.2000/- ක් වේ.

* රාජකාරි කටයුතු සඳහා සංචාරක බංගලාව වෙන් කිරීමේදී පිරිසිදු කිරීමේ ගාස්තුව රු.300/- ක් සහ මුළුතැන් ගෙය භාවිතය සඳහා රු.600/- ක මුදලක් අය කරනු ලැබේ.

ඉහත ගාස්තු අය කිරීම එක් දිනක් සඳහා එක් කාමරයකට වන අතර එම ගාස්තු වලට අමතරව සේවා ගාස්තු සඳහා රු.600/- ක මුදලක් මහනුවර දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ සුභ සාධක සංගමයට ගෙවිය යුතුය.

මීට අමතරව පිරිසිඳු කිරීමේ වියදම් හා ගෑස් භාවිත කරන්නේ නම් ඒ සඳහා වියදම් (රු.1000/-) බංගලා භාරකරු වෙත ගෙවිය යුතුයි

සංචාරක බංගලාව වෙන් කරවා ගැනීම සඳහා අයදුම් පත් ප්‍රධාන කාර්යාලයෙන් / දිස්ත්‍රික් කාර්යාල වලින් හෝ අපගේ www.luppd.lk අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

වැඩි විස්තර සඳහා අමතන්න.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ආයතන අංශය :- **0112500338**







**<u>ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට අයත් පල්ලෙකැලේ සංචාරක නිවාසය වෙන් කරවා ගැනීමට අදාලව ඉල්ලුම්කරුවන් විසින් එකඟ විය යුතු කොන්දේසි</u>**

i. රජයේ නිලධාරින්ට සහ රාජ්‍ය සේවයෙන් විශ්‍රාමික නිලධාරින් සඳහා පමණක් වෙන් කිරීම් සිදු කළ හැකි අතර ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අංක 170,කිරුළ පාර,නාරාහෙන්පිට,කොළඹ 05 යන ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලය මඟින් පමණක් වෙන් කිරීම් සිදු කරනු ලැබේ.(දු.ක. – **(011) 2 500 338 / ෆැක්ස් - (011) 2 368 718)**

ii. කාමර ගාස්තු මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ඇති **ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ** ගිණුම් අංක **7040813** ට තැන්පත් කිරිම හෝ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ ගෙවීම පමණක් සිදු කළ හැක.

iii. නවාතැන් ගත හැකි **උපරිම නේවාසිකයින් සංඛ්‍යාව 11** ක් වන අතර අයදුම්පතෙහි සඳහන් පිරිස ඉක්මවා රඳවා ගැනීම සිදු නොනළ යුතුයි.

iv. කාමර වෙන් කිරිම සඳහා ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු අතර රාජකාරි හැඳුනුම්පතේ පිටපතක් හෝ විශ්‍රාමික හැඳුනුම්පතේ පිටපත්ක් ඉදිරිපත් කළ යුතුය.

v. කාමර වෙන් කිරීම සිදු කර ඇති අවස්ථාවකදි එම වෙන් කිරිම අවලංගු කිරීමට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

vi. නවාතැන් ගන්නා දිනයක් ලෙස සලකනු ලබන්නේ ප.ව 2.00 සිට පසු දින ප.ව. 2.00 දක්වා වේ.

vii. මෙම සංචාරක බංගලාවේ සියළුම දේපළ රජය සතු වන අතර නවාතැන් ගැනීමේදී නවාතැන්කරුවන් විසින් එම දේපළ වලට හානි පැමිණවීම සිදු නොවන ලෙස භාවිතා කළ යුතු වේ.එසේ අලාභ හානි සිදු වුවහොත් අය කර ගැනීමට යටත් වේ.

viii. නිවාස භාරකරු විසින් නවාතැන්කරුවන් වෙත ලබා දෙන උපදෙස් පිළිපැදිය යුතු අතර අනෙකුත් නේවාසිකයින්ට හිරිහැරයක් සිදු නොවන අයුරින් නිරන්තරයෙන් කටයුතු කළ යුතු වේ.

ix. මත්පැන් දුම්වැටි භාවිතා කිරීම තහනම් වේ.

x. මල් පැළ,බෝග වර්ග වලට හානි කිරීමෙන් / කැඩීමෙන් වැලකී සිටිය යුතුයි.

xi. මුළුතැන්ගෙයි උපකරණ නිවාස භාරකරුගේ අවසරය මත පමණක් ලබා ගත යුතු අතර භාවිතයෙන් පසු නිසි පරිදි පිරිසිදු කර නැවත භාර දිය යුතුයි.එම භාණ්ඩ වලට අලාභයක් සිදු වුවහොත් අය කිරිමට යටත් වේ.

xii. නවාතැන් ගැනීමෙන් අනතුරුව කාමර වල යතුරු නිවාස භාරකාරුට පමණක් භාර දිය යුතු අතර භාර දීමේදි සියළු ගෙවීම් සිදු කළ යුතු වේ.කාමර පරික්ෂා කිරීමෙන් පසුව පමණක් නේවාසිකයින් නිදහස් කරනු ලැබේ.(මුළුතැන් ගෙය භාවිතා කිරිම සහ පිරිසිදු කිරිමේ ගාස්තුව)

xiii. නවාතැන්කරුවන් නවාතැන්ගැනීමෙන් පසුව ඉවත්ව යාමේදී තමා සතු සිළු බඩුබාහිරාදිය රැගෙන යා යුතු අතර පසුව සිදු කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් වගකියනු නොලැබේ.

පහත සඳහන් මාර්ග සිතියම අනුව අපගේ සංචාරක බංගලාව වෙත ලඟා විය හැක.



## ස්තූතියි





GUIDING FOR BETTER LAND USE

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව



## මහනුවර - පල්ලෙකැලේ සංචාරක බංගලාව



